# ලංකා බැංකුව

ලංකා බැංකුව යනු ලන්ඩනයේ බැංකු අනුබද්ධිත ආයතනයක් සහ විදෙස් රටවල් ගණනාවක මෙන්ම දිවයින පුරාම ක්‍රියාත්මක වන ශාඛා ජාලයක් ඇති ශ්‍රී ලංකාවේ විශාලතම බැංකු ආයතනයයි. එමෙන්ම ලංකාවේ අංක 01 සහ ලෝකයේ හොඳම 1000 අතරට ශ්‍රේණිගත වූ එකම ශ්‍රී ලාංකික බැංකුව ද අපි වෙමු.

අපගේ නීති දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරු සඳහා මනා ලෙස සුදුසුකම් ලැබූ තැනැත්තන් අප විසින් අපේක්ෂා කෙරේ:

## අභ්‍යාසලාභී උසාවි ලිපිකරු සහ අභ්‍යාසලාභී නොතාරිස් ලිපිකරු

### යෝග්‍යතා නිර්ණායක

- ශ්‍රී ලාංකීය පුරවැසියකු විය යුතුය.
- **සුදුසුකම් හා පළපුරුද්ද**
  - මව් භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ 5ක් හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සමත් වී තිබීම

    සහ

  - එක් වරකදී විෂයයන්3ක්(සාමාන්‍ය ඉංග්‍රීසි හා සාමාන්‍ය දැනීම හැර) අ.පො.ස. උසස් පෙළ විභාගය සමත් වී තිබීම

    සහ

  - නීතිඥ සමාගමක හෝ නීතිඥයකු යටතේ උසාවි ලිපිකරුවකු/ නොතාරිස් ලිපිකරුවකු වශයෙන් වසර 2ක පළපුරුද්ද
- වෙනත් සුදුසුකම්
  - පරිගණක යතුරුලිවීමේ වේගය:

    අභ්‍යාසලාභී උසාවි ලිපිකරු - ඉංග්‍රීසි භාෂාවෙන් විනාඩියට වචන 20 සහ සිංහල/ දෙමළ භාෂාවෙන් විනාඩියට වචන 20<br>
    අභ්‍යාසලාභී නොතාරිස් ලිපිකරු- ඉංග්‍රීසි භාෂාවෙන් විනාඩියට වචන 20
  - පරිගණක සාක්ෂරතාව හා ඉංග්‍රීසි භාෂාව මනා ලෙස හැසිරවීමේ හැකියාව අත්‍යවශ්‍ය වේ.
- **වයස**

  අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 35ක් හෝ ඊට අඩු විය යුතුය.

### නියමයන් හා කොන්දේසි

- පුහුණු කාල සීමාව වසර දෙකක් (02) වන අතර පුහුණු කාලය තුළ (පළමු වසර සඳහා මසකට රු. 55,000/- බැගින් හා දෙවන වසර සඳහා - මසකට රු. 70,000/- බැගින්) මාසික දීමනාවක් ගෙවනු ලැබේ.
- මෙම තනතුර බැංකු සේවයෙහි සාමාන්‍ය නියමයන් හා කොන්දේසිවලට යටත් වන නමුදු සාමාන්‍ය බැංකු ක්ෂේත්‍රයට පරිබාහිර (සංවෘත සේවය) වේ.
- පුහුණු කාල සීමාවේ බැංකුව සෑහීමට පත්වන ආකාරයට අවශ්‍යතා සපුරාලීමෙන් පසු ස්ථිර කාර්ය මණ්ඩලයේ උසාවි ලිපිකරු - 1/ නොතාරිස් ලිපිකරු - 1 ශ්‍රේණියේ ස්ථිර කරනු ලැබේ. අවශ්‍ය වුවහොත්, කාර්යාල වේලාවට අමතරව සති අන්ත/නිවාඩු දිනවල සේවයෙහි යෙදීම අපේක්ෂා කෙරේ.
- බැංකුවේ අවශ්‍යතාව අනුව රටේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.

### තෝරාගැනීමේ පටිපාටිය

තරග විභාගයක්(ලිඛිත පරීක්ෂණයක් හා පරිගණක යතුරු ලියන වේගය පිළිබඳ පරීක්ෂණයක්) හා ඉන්පසුව පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

විභාගයෙන් ලබාගත් ලකුණු සම්මුඛ පරීක්ෂණය සඳහා අපේක්ෂකයන් කැඳවීමට පමණක් භාවිත කරනු ලැබේ. අවසාන තෝරාගැනීම් සිදුකරනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු අනුව කුසලතා මත පදනම්ව ය.

### අයදුම් කිරීමේ පටිපාටිය

අපගේ වෙබ් අඩවිය වන **www.boc.lk ("careers"** තීරය) යටතේ බාගත හැකි ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව සකසන ලද ඔබගේ ජීවදත්ත පත්‍රිකාව, උප්පැන්න සහතිකයේ, ජාතික හැඳුනුම්පතේ, අදාළ සියලුම අධ්‍යාපනික සහතිකපත්වල සහ ඔබේ පළපුරුද්ද සනාථකිරීමේ සහතික/ ලේඛනගත සාක්ෂිවල ඡායාස්ථ පිටපත් සමග **2024 ජූලි මස 27 වන දින හෝ ඊට පෙර** අප වෙත ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතු අතර අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කරන ලද තනතුර ද සඳහන් කළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති හෝ අදාළ සනාථකිරීමේ ලේඛනවල ඡායාස්ථ පිටපත් නොමැතිව හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත්කරන හෝ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව එවන ඕනෑම අයදුම්පතක් කිසිඳු දැනුම්දීමකින් තොරව බඳවා ගැනීමේ ඕනෑම අදියරකදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන කළමනාකරු (බඳවාගැනීම් හා වෘත්තීය සංවර්ධන),**<br>
**ලංකා බැංකුව, 26 වන මහල - ප්‍රධාන කාර්යාලය,**<br>
**"ලංකා බැංකු චතුරශ්‍රය" අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.**

- බැංකුව වෙත කුමන අයුරකින් හෝ බලපෑමක් කිරීම ඔබ මෙම තනතුර සඳහා වහාම නුසුදුසු බවට පත්කිරීමට හේතුවේ.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.
- සම්පූර්ණ කළ යුතු තනතුරු සංඛ්‍යාව හෝ බඳවා ගැනීම කල් දැමීමේ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.
- බැංකුවේ පෞද්ගලික දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව, බැංකුව විසින් ඔබේ තොරතුරුවල පෞද්ගලික භාවය හා රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ.


1975 BOC CALL CENTRE

www.boc.lk

A (lka) Fitch ශ්‍රේණිගත කිරීම AAA Brand Finance ශ්‍රේණිගත කිරීම
ලංකා බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.

ප්‍රධාන කාර්යාලය, BOC චතුරස්‍රය,
අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ